බුද්ධශාසන ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය
புத்தசாசன மத மற்றும் கலாச்சார அலுவல்கள் அமைச்சு
Ministry of Buddhasasana, Religious and Cultural Affairs

# ටවර් හෝල් රඟහල පදනම
## டவர் மண்டப அரங்க மன்றம்
## Tower Hall Theatre Foundation

''සව්සිරිපාය'' 123, විජේරාම මාවත, කොළඹ 07. சவ்சிரிபாய'', 123, விஜேராம மாவத்தை, கொழும்பு07.' Sausiripaya'123, Wijerama Mawatha, Colombo 07.
Tel.**011-2682324 Fax 011-2678517 E-mail-towersl@sltnet.lk Web- towerhall.lk**

---

**මගේ අංකය : TF/AD/09/0**5

**2026-0**9-2**9 දින.**

<u>කුලී පදනම මත වායුසමනය කළ බස් රථයක් ලබා ගැනීම සඳහා මිල ගණන් කැඳවීම</u>

ටවර් හෝල් රඟහල පදනම මඟින් මාසික ජීවනධාර දීමනා ලබන ශිල්පීන් සඳහා වාර්ෂික වන්දනා චාරිකාවක් සංවිධානය කිරීමට කටයුතු කර ඇත. ඒ සඳහා ශිල්පීන් ඇතුළු රාජකාරි කටයුතු වෙනුවෙන් සහභාගි වන කාර්ය මණ්ඩලය 45 දෙනෙකුගෙන් සමන්විතය. ඒ අනුව ආසන 45කින් යුත් වායුසමනය කරන ලද බස් රථයක් කුලී පදනම මත එදිනට ලබා ගැනීම සඳහා මිල ගණන් කැඳවීමට අවශ්‍යව ඇත.

මෙම වන්දනා චාරිකාව සඳහා 2026-10-23 දින පෙ.ව. 6.00ට මරදාන ටවර් රඟහලින් ගමන් ආරම්භ කර හලාවත මුන්නේශ්වරම් කෝවිල, කුරුණෑගල පල්ලිය හා ඒ අවට ස්ථාන වෙත ගමන් කර, වැඩසටහන අවසන් කිරීමෙන් අනතුරුව නැවත එම මාර්ගය ඔස්සේ මරදාන ටවර් රඟහල වෙත රාත්‍රී 10.00 වන විට පැමිණීමට අපේක්ෂිතය.

ඉහත සඳහන් පරිදි ප්‍රවාහන පහසුකම් සැපයිය හැකි වායුසමනය කළ බස් රථයකට අදාළ මිල ගණන් වර්ෂ - 2026-10-14 දින පෙ.ව.11.30 ට පෙර ලැබෙන සේ **සභාපති,ප්‍රසම්පාදන කමිටුව, ටවර් හෝල් රඟහල පදනම, සව්සිරිපාය, අංක 123, විජේරාම මාවත, කොළඹ-07** ලිපිනයට අතින් ගෙනවිත් හෝ ලියාපදිංචි තැපෑලෙන් ලැබීමට සලස්වන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි. මිළ ගණන් ලබාගැනීම අවසන් වූ සැනින් එම මිළ ගණන් විවෘත කරනු ලබන අතර එම අවස්ථාවට ලංසුකරුට හෝ ලංසුකරුගේ බලයලත් අයෙකුට සහභාගි විය හැකිය. ප්‍රමාද වී ලැබෙන මිළ ගණන් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

මිල ගණන් බහාලන කවරයේ ඉහළ වම් කෙළවරේ **''කුලී පදනම මත වායුසමනය කළ බස් රථයක් ලබා ගැනීම සඳහා මිල ගණන්''** ලෙස සඳහන් කරන මෙන් වැඩිදුරටත් කාරුණිකව දන්වා සිටිමි.

නිපුණ දිසානායක

අධ්‍යක්ෂ (පාලන හා සංවර්ධන)

**දු.ක. : 0112682324**
**ෆැක්ස් අංකය : 0112678517**
**විද්‍යුත් තැපැල : towersl@sltnet.lk**